“පුතේ සසිරු නැගිටින්න පෙර පාසල් යන්න පරක්කු වෙනවා” අම්මා සසිරුට කතා කළා.

“අද මම පෙර පාසල් යන්නේ කාත් එක්කද ?” සසිරු නැගිටින ගමන් අම්මාගෙන් ඇහුවා.



“අද පෙර පාසල් යන්නෙ අම්මත් එක්ක බස් එකේ”අම්මා සසිරුට කිව්වා.

“මම බස් එකේ යන්නෙ ගොඩාක් දවසකින්” සසිරු හරි සතුටින් කිව්වා.



“එහෙනම් ඉක්මනට ලෑස්ති වෙන්න මගේ පුතා” අම්මා ආදරයෙන් සසිරුට කිව්වා.

“අපේ බස් එකේ යාළු කොන්දොස්තර මාමා ඉදීවි ද ?

ගොඩාක් දවසකින් කොන්දොස්තර මාමා දැක්කෙ නෑනෙ”

සසිරු අම්මාට කිව්වා.

“පුතා තව ටිකක් ඉක්මන් කළොත් කොන්දොස්තර මාමා බලන්න පුළුවන්”

අම්මා එහෙම කිව්වා.

මම පරක්කු වුණොත්
කොන්දොස්තර මාමා දකින්න
වෙන්නෙ නෑ සසිරුට හිතුණා.

මම ඉක්මනට ලෑස්ති වෙන්න ඕනෙ
කියලා හිතමින් සසිරු පෙර පාසල්
යන්න ලෑස්ති වුණා.

"පුතා ලෑස්තිවෙලා ඉවරද?"
අම්මා සසිරුගෙන් ඇහුවා.

"ඔව් අම්මේ මම ලැස්තිවෙලා
ඉවරයි" කියමින් සසිරු බෑග් එක
කරට දාගෙන අම්මා ළඟට ආවා.

"ආ අද පුතා ඉක්මනට ලෑස්ති
වෙලා" කියමින් අම්මා ගෙදර
දොර වහන්න සූදානම් වුණා.



“මම ටීචට දෙන්න ගත්ත මල් ටික අම්මා ගන්න කෝ” කියමින් පාරට යන ගමන් සසිරු මල් ටික අම්මාට දුන්නා.




“අන්න බස් එක එනවා පුතා පරෙස්සමට නගින්න” අම්මා සසිරුට කිව්වා.

“ආ පුතා ගොඩක් දවසකින්” කොන්දොස්තර මාමා සිනාසෙමින් සසිරුව පිළිගත්තා.

“ඔව් මාමෙ තාත්තා දුර ගමනක් ගිහින් අද අම්මත් එක්ක පෙර පාසල් යනවා” සසිරු සිනාසෙමින් කිව්වා.

කොන්දොස්තර මාමා දැන් හරිම සතුටින් බස් එකේ එහාට මෙහාට යමින් ටිකට් දෙනවා සසිරුට දකින්න පුළුවන් වුණා.




සසිරු සතුටින් කොන්දොස්තර මාමා දිහා බලන් හිටියා.
"මගේ මුණ දැන් ඉස්සරට වඩා ලස්සනයි කියලා හැමෝම කියනවා" කොන්දොස්තර මාමා සසිරු ළඟටම ඇවිත් කිව්වා.

"ඇත්තමයි මාමගෙ මූණ දැන් ලස්සනයි, මාමා ඉන්නෙත් හරිම සතුටින්" සසිරු කොන්දොස්තර මාමාට කිව්වා.

“අරක්කු බිව්වාම මූණ කැතවෙනවා
කියලා පුතා මට කියලා දුන්න නිසා
අරක්කු බොන එක නතර කළා මම
දැන් අරක්කු බොන්නෙ නෑ”

කොන්දොස්තර මාමා සසිරුට
කිව්වා.



කොන්දොස්තර මාමා වීරයෙක් වගේ
පෙනුණ සසිරු හිනාවෙලා
ආඩම්බරයෙන් අම්මා දිහා බැලුවා.

බස් එකෙන් බහින තැන ළං වූ නිසා
අම්මා මගේ අතින් අල්ලාගෙන
බහින්න සූදානම් වුණා.

“පුතා පරෙස්සමින් බහින්න”
කොන්දොස්තර මාමා කිව්වා.

“අරක්කු බිව්වාම මුණ කැත වෙනවා කියලා පුතා හැමෝටම කියලා දෙන්න”

කොන්දොස්තර මාමා සතුටින් සසිරුට කිව්වා.

බස් එකෙන් බැසගත් සසිරු කොන්දොස්තර මාමාට ටටා කියලා අම්මාගේ අතේ එල්ලිලා යන්න පිටත් වුණා.



## නුවණක්කාර ළමයි

### සිගරට් බොන අය දැක්කම

## නහය වහගන්නවා



ADIC
Alcohol and Drug Information Centre

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
40/18, උද්‍යාන පාර, කොළඹ 05.
දුක: 011 2584416, ෆැක්ස්: +94 112508484
http://adicsrilanka.org

# අලුත් වැඩක් කළ සසිරු



මද්‍යසාර සහ
මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ
**ප්‍රකාශනයක්**

ADIC
Alcohol and Drug Information Centre

## සෑම දරුවෙකුම සතුටින් තියන්නට වෙහෙස වන පෙර පාසල් ගුරු මෑණිවරුන් උදෙසා............

දරුවන් කුඩා කල සිට මද්‍යසාර, දුම්වැටි වලට හුරු කිරීම උදෙසා ක්‍රියා කරන එම සමාගම් වල උපක්‍රම වලට දරුවන් තුල ප්‍රතිශක්තිකරණය ඇති කිරීමේ අරමුණෙන්, පෙර පාසල් ගුරුවරුන්ට මෙම කතාන්තර දරුවන්ට කියා දිය හැකි ආකාරයට මෙම පොත නිර්මාණය කර ඇත.

පිරිමි දරුවන් බොහෝ දෙනෙක් ආස කරන බස්රථය සහ කොන්දොස්තර මාමා ගේ චරිතය යොදා ගනිමින් මෙම කතාව ගොඩනංවා ඇත.

ධනාත්මකව දරුවා දිරිගන්වන ආකාරය, සැලකිලිමත් වියයුතු අවස්ථාවන් පිළිබඳව, කෙනෙකු සිනාසී පිළිගැනීම,

ගුරුතුමියට මල් මිටක් රැගෙන යාම වැනි හොඳ ගුණාංගයන් ඇතුළත් කර ඇත.

අරක්කු බිව්වම මූණ කැත වෙනවා ඒ වගේම අරක්කු බොන එක නතර කළාම ලස්සන සහ සතුට ළඟා වන බව පෙන්වා දී ඇත.

අරක්කු බිව්වම මූණ කැත වෙනවා කියන පණිවිඩය දරුවන්ට සතුටින් හැමෝටම කියලා දිය හැකි කරුණක් බව පෙන්වීමට උත්සාහ කර ඇත.

---

ඔබගේ අදහස් අපට වැදගත්

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
40/18, උද්‍යාන පාර, කොළඹ 05.
දුක: 011 2584416, ෆැක්ස්: +94 112508484
http://adicsrilanka.org

**චිත්‍ර නිර්මාණය -**
තේජා දෙහිවත්ත

**පිටු සැකසුම -**
හර්ෂණ නිමලසූරිය

**සංකල්පය -**
මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)